# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2022-04-30 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ.

**වෛද්‍ය පීඨය**

**ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය**

කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

**අනුක වෛද්‍ය ඒකකය**

විද්‍යාත්මක සහකාර II

**වෛද්‍ය මධ්‍යස්ථානය**

වෛද්‍ය නිලධාරී

දන්ත වෛද්‍ය නිලධාරී

ඉහත සඳහන් එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් හා අදළ සියලුම තොරතුරු https://www.kln.ac.lk/vacancies මගින් ලබාගත හැක.

**වැටුප් පරිමාණය :**

1. **කථිකාචාර්ය (ආධුනික)**
   රු. 54,600 - 10 x 1,335 - 67,590 p.m. (U-AC 3 (IV)) (ආසන්න දළ වැටුප රු. 141,110/-)
2. **කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)**
   රු. 69,580 - 5 x 1,630 - 77,730 p.m. (U-AC 3 (II)) (ආසන්න දළ වැටුප රු. 187,445/-)
3. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II**
   79,360 - 11 x 1,630 - 97,290 p.m. (U-AC 3 (II)) (ආසන්න දළ වැටුප රු. 227,865/-)
4. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I**
   රු. 91,310 - 7 x 2,170 - 106,500 p.m. (U-AC 3 (I)) (ආසන්න දළ වැටුප රු. 260,250/-)
5. **විද්‍යාත්මක සහකාර II**
   රු. 48,385 - 19 x 690 - 61,495 p.m. (U-AS 1 (I)) (ආසන්න දළ වැටුප රු. 92,635/-)
6. **වෛද්‍ය නිලධාරී / දන්ත වෛද්‍ය නිලධාරී**
   රු. 55,350 - 10 x 1,335 - 10 x 1,630 - 85,000 p.m. (U-MO 1 (II)) (ආසන්න දළ වැටුප රු. 123,500/-)

**අයදුම් කරන පිළිවෙළ**

මෙම තනතුරු සඳහා අදළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැකිය. එසේම අන්තර්ජාලයෙන් https://www.kln.ac.lk/vacancies විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදළ අයදුම්පත සහ තොරතුරු බාගත (Downloads) කර ගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍යනම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ.මී. 23X10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය. **අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත්** යොමුකළ යුතු අතර, අයදුම්පත් අදළ සහතිකවල පිටපත් සමග 2022-04-30 දින හෝ ඊට ප්‍රථම නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හා පහත විද්‍යුත් ලිපින වෙත යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර, දෙපාර්තමේන්තුව හා විද්‍යුත් තැපැල මගින් අයදුම්පත් එවීමේදී මාතෘකාව (Subject) සඳහන් කරන තීරයේ ඉල්ලුම් කරනු ලබන තනතුර හා දෙපාර්තමේන්තුව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| | |
|---|---|
| වෛද්‍ය පීඨය | - applyme@kln.ac.lk |
| විද්‍යාත්මක සහකාර II | - aead@kln.ac.lk |
| වෛද්‍ය නිලධාරී / දන්ත වෛද්‍ය නිලධාරී | - applycm@kln.ac.lk |

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ.** අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ සම්පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**
**කැලණිය.**

2022-04-04